සාධු දැක්ම
The Excellent View

9

ජය පිරිත
Recital for Invoking Victory

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

ජය පිරිත

Recital for Invoking Victory

IN

PALI

SINHALA

&

ENGLISH

BY

Kiriwattuduwage Seetha Nandanie Goonetilleke
(Director of Parents Memorial Scholarship Foundation)
011 2 877950

ප්‍රථම මුද්‍රණය - 2023
බුද්ධ වර්ෂ - 2567

සාධු දැක්ම-The Excellent View- ⑨

(ජය පිරිත-: Recital for Invoking Victory.)

කර්තෘගේ වෙනත් පොත් :-

1. මා පිය ගුණ සමර
2. සාධු දැක්ම-The Excellent View ①
3. දරිද්‍රතාව හඹා යයි.
4. සුවදායක මාවතක් - A Blissful Path
5. ප්‍රීතිමත් ජීවිතයකට මඟ
6. තුදුස් වසරක සඟන් එළියක්- A Moon Light of 14 years
7. සාධු දැක්ම-The Excellent View ② කරණීය මෙත්ත සූත්‍රය ඇසුරෙනි
8. සාධු දැක්ම-The Excellent View ③ රතන සූත්‍රය ඇසුරෙනි.
9. සාධු දැක්ම-The Excellent View ④ ජිනපඤ්ජරය ඇසුරෙනි
10. සාධු දැක්ම-The Excellent View ⑤ මහා මඞ්ගල සූත්‍රය ඇසුරෙනි
11. සාධු දැක්ම-The Excellent View ⑥ සංහිඳියාවට මඟක්
12. සාධු දැක්ම-The Excellent View ⑦ ගිරිමානන්ද සූත්‍රය ඇසුරෙනි
13. සාධු දැක්ම-The Excellent View ⑧ සිගාලෝවාද සූත්‍රය ඇසුරෙනි

පටුන

- උත්තම පූජා 4
- SALUTATION 5
- කෘතඥතාවය 6
- පුණ්‍යානුමෝදනාව 7
- ජය පිරිත (උච්චාරණය සඳහා) 8 9
- Jaya Piritha(for recitation) 10-12
- ජය පිරිත (සිංහල අරුත) 13
13
- Jaya Piritha(English-meaning)
14
- The value of ' Piritha'(English)
15-18
- පිරිතෙහි වටිනාකම (සිංහල)
17
- බුද්ධානුස්සතිය (සිංහල + English)
19-23

MRS : K. SEETHA M. GOONETILLEKE
DIRECTOR
Parents Memorial Scholarship Foundation
392/2, Perera Mawatha,
Koluwegoda - Rajagiriya.
Tel: 0112877050

උත්තම පූජා

මල්වතු පාර්ශවයේ, සියම් නිකායේ අනුනායක ධූරංධර,
විශ්ව කීර්ති, ශාසන ශෝභන
අති පූජ්‍ය, ගෞරවාර්හ

නියංගොඩ විජිතසිරි ස්වාමීන් වහන්ස,

ධර්මිෂ්ඨ චින්තනයක් ඔස්සේ, යහපත් වූ සෘජු
මාවතකට පිවිස, ප්‍රඥාසම්පන්නව ඉදිරියටම පා නගමින්,
මංමුලාවී සිටින සමස්ථ ලෝක ප්‍රජාවට ආදර්ශයක් දෙමින්,
යහපත් සමාජයක් ගොඩ නැගීමේ
දැවැන්ත කාර්ය භාරයකට
නිහඬව උරදෙන,
ඔබ වහන්සේට,

මවිසින් සම්පාදනය කෙරෙන, "සාධු දැක්ම" ග්‍රන්ථ මාලාවේ
9 වන කලඹ වූ, මෙම කුඩා සදහම් ග්‍රන්ථය

බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව පූජා කරමි.

පූජා වේවා !!

පූජා වේවා !

*

SALUTATION

To my beloved Parents in eternal gratitude.

I offer this book,"The Excellent View – 9"
as a floral tribute, at the feet of my parents

Late Mr Wijayasena Kiriwattudu and
Late Mrs Laura Hettiarachchi,

who inspired me to lead a harmonious life
dedicated to the service of mankind.

You, my dear Father and my dear Mother,
embodied the ideal fatherhood
and Motherhood
and
brought me up, with boundless love and care,
guiding me towards
what is good, virtuous & wholesome.

MAY YOU ATTAIN EVERLASTING

BLISS of NIBBANA

(Kiriwattuduwage Seetha nandanie Goonetilleke)

*

කෘතඥතාවය

ජය පිරිත අනුසාරයෙන් මෙවන් පොත් පිංචක් සකස් කිරීමට පසුබිම් වූ කළ්‍යාණ මිත්‍ර ඇසුර මහත් සේ අගයමි."සාධු දැක්ම" ග්‍රන්ථ පෙළ පරිශීලනයෙන් පසු, සැදැහැවත් ගුණවත් පාඨක භවතුන් විසින් කරනු ලැබූ දිරිගැන්වීම් සහ ඉල්ලීම් හමුවේ මෙමග්‍රන්ථකරණය ඉදිරියටම ඇදී යාම, නිරාමිස ප්‍රීතියට හේතු වී ඇති බව නිහතමානීව සඳහන් කරමි.

සසර ගමනේ හමු වී ඇති කළණ මිතුරු ඇසුර නැවතසිහිපත් කෙරෙන මොහොතක් උදා වූයේ අනපේක්ෂිතවය. මා වෙත ලැබුණා වූ දුර කථන පණිවිඩය ඉතාමත් සුභද්‍රශීලී විය. සවනට මිහිරි, දහමට බර, ආකර්ශණීය එම සංවාදය හමුවේ එතුමිය හඳුණා ගතිමි. ඒ අන් කවරෙකුවත් නොව අති පූජනීය **නියංගොඩ විජිතසිරි අනුනායක ස්වාමීන් වහන්සේගේ** ගිහිකල සාහොයුරිය යි.ඉතාමත් නිහතමානී, කාරුණික විශ්‍රාමික ගුරුමාතාවක් වූ, නමින් කේ.නියංගොඩ නම් වූ එතුමියගේ කාරුණික ඉල්ලීම වූයේ "ජය පිරිත" අන්තර්ගත ග්‍රන්ථයක් සකස් කර දෙන ලෙසටයි.

පවත්නා සමාජයීය ව්‍යාකූල අස්ථාවරත්වය හමුවේ මුද්‍රණ කටයුතු ආකර්ශණීය ලෙස නිමා කර ගැනීම, තරමක අභියෝගයක් වුවද, මෙම ග්‍රන්ථය ද, දැඩි කැපවීමකින් යුතුව හැකි ඉක්මනින්, සාර්ථක අන්දමින් බාහු බලයෙන් හෝ නිමා කිරීමට මම අදිටන් කර ගතිමි.

කෙසේ වුවද, "සාධු දැක්ම" තවත් පියවරක් ඉදිරියට තැබීමට, මා උනන්දු කරවමින්, සුභාශිංසන එවනු ලැබූ එතුමියට මම හිස නමා ආචාර කරමි.

පුණ්‍යානුමෝදනාව

සදහම් රුචි, යහගුණ කැමති සමාජයකට තිළිණ කිරීම සඳහා
සකස් කරනු ලැබූ මෙම සදහම් ග්‍රන්ථය,

2022 ජූලි මස 19 දිනට යෙදී ඇති අප දයාබර පියාණන් වූ

විශ්‍රාමලත් විදුහල්පති, විජයසේන කිරිවත්තුඩුව මැතිතුමාගේ
17 වන ගුණානුස්මරණ පිංකම වෙනුවෙනි

මෙම ධර්මදානයේ කුසලානිශංස එතුමාටත්, අප දයාබර මෑණියන්වූ
විශ්‍රාමලත් විදුහල්පතිනි, ලෝරා හෙට්ටිආරච්චි මැතිනියට ත්

අප දෙපාර්ශවයේ මිය ගිය අනිකුත් සියලුම ඥාති මිත්‍රාදීන්ට සහ
අප ලේලි දියණියන්ගේ දයාබර මෑණියන් දෙපලටත්,

මෙම ග්‍රන්ථකරණය ඉදිරියටම කර ගෙන යාමට නන් අයුරින්
සහයෝගය ලබා දුන් ඥාති, මිත්‍ර හිතෛෂී සත්පුරුෂ සැමටත්,

මෙම සියලුම පින් ලැබේවා! යි අනුමෝදන් කරවමි.
අනුමෝදන් වේවා !

අවසානයේදී මෙම ධර්ම දානයෙන් රැස් කර ගන්නා වූ සියලුම
පින් පාඨක ඔබ - අප සැමටත්, මෙම ඝෝර සංසාරයෙන්
එතෙර වීම සඳහා, අති උතුම් වූ පරම රමණීය
නිර්වාණ සුවය සාක්ෂාත් කර ගැනීමට

හේතු වාසනා වේවා !!!
සාධු ! සාධු !! සාධු !!!

සතුට, සෞභාග්‍යය ළඟා කර දෙන මහානුභාව සම්පන්න

ජය පිරිත (පාලි උච්චාරණය සඳහා)

සිරි ධිති මති තේජෝ ජයසිද්ධි මහිද්ධි මහා ගුණං
අපරිමිත පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණ
සමත්ථස්ස.භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස.

ද්වත්තිංසමහාපුරිස-ලක්ඛණානුභාවේන
අසීත්‍යනුව්‍යඤ්ජන-ලක්ඛණානුභාවේන
අට්ඨුත්තරසතමංගල-ලක්ඛණානුභාවේන,
ඡබ්බණ්ණරංස්‍යනුභාවේන,
කෙතුමාලානුභාවේන,
දසපාරමීතානුභාවේන,
දසඋප-පාරමීතානුභාවේන,
දසපරමත්ථ-පාරමීතානුභාවේන,
සීලසමාධිපඤ්ඤානුභාවේන,
බුද්ධානුභාවේන,ධම්මානුභාවේන,
සංඝානුභාවේන,තේජානුභාවේන,
ඉද්ධ්‍යානුභාවේන,බලානුභාවේන,
ඤෙය්‍යධම්මානුභාවේන,
චතුරාසීතිසහස්සධම්මක්ඛන්ධානුභාවේන,
නවලොකුත්තර-ධම්මානුභාවේන
අට්ඨංගිකමග්ගානුභාවේන,
අට්ඨසමාපත්ත්‍යානුභාවේන,
ඡළභිඤ්ඤානුභාවේන,මෙත්තා,කරුණා,
මුදිතා,උපෙක්ඛානුභාවේන,
සබ්බපාරමීතානුභාවේන,

රතනත්තය-සරණානුභාවේන,තුය්හං
සබ්බරෝග-සෝක-උපද්දව
දුක්ඛදෝමනස්සුපායාසා,විනස්සන්තු.
සබ්බසංකප්පා තුය්හං සමිජ්ඣන්තු දීඝායුකෝ
හෝතු,සතවස්ස-ජීවේන-සමංගිකෝහෝතු
සබ්බදා.

ආකාස පබ්බත වනභූමිතටාකගංගා මහාසමුද්ද
ආරක්ඛක දේවතා සදා තුම්හෙ අනුරක්ඛන්තු.
සබ්බබුද්ධානුභාවේන, සබ්බ ධම්මානුභාවේන,
සබ්බසංඝානුභාවේන,
බුද්ධරතනං ධම්මරතනං සංඝරතනං තින්නං
රතනානං ආනුභාවේන, චතුරාසීති
සහස්සධම්මක්ඛන්ධානුභාවේන,
පිටකත්තයානුභාවේන, ජිනසාවකානුභාවේන,
සබ්බේ තෙ රෝගා, සබ්බේ තෙ භයා, සබ්බේ තෙ
අන්තරායා, සබ්බේ තෙ උපද්දවා, සබ්බේ තෙ
දුන්නිමිත්තා, සබ්බේ තෙ අවමංගලා විනස්සන්තු.

ආයුවඩ්ඪකෝ, ධනවඩ්ඪකෝ, සිරිවඩ්ඪකෝ,
යසවඩ්ඪකෝ, බලවඩ්ඪකෝ, වණ්ණවඩ්ඪකෝ,
සුඛවඩ්ඪකෝ, හෝතු සබ්බදා.

දුක්ඛරෝගභයාවේරා – සෝකා සබ්බේ
උපද්දවා
අනේකා අන්තරායාපි – විනස්සන්තු ච තේජසා
ජය සිද්ධි ධනං ලාභං – සොත්ථිභාගායං සුඛං
බලං
සිරි ආයුව වණ්ණො ච – භොගං වුද්ධි ච යසවා
සත්වස්සා ච ආයූ ච – ජීවසිද්ධිභවන්තු තේ.

Jaya Paritta – In English for Recitation

(to gain protection,security,and victory)

Siri dhitimati tejo
Yaya siddhi mahiddhi mahagunam
aparimita puññadhi-kãrassa
sabbantarãya nivarana samatthassa
bhagawato arahato Samma
Sambuddhassa.

dwattimsa mahãpurisa lakkhanãnu
bhãvena,asitya-nubbyanjana
lakkhanãnu bhãvena, atthuttara
sata mangala lakkhanãnu bhãvena
chabbanna-ramsyãnu bhãvena
ketumãlãnu bhãvena, dasa
pãramitãnu bhãvena
dasa upa pãramitãnu bhãvena
dasa paramattha pãramitãnu bhãvena

sila Samadhi paññãnu bhãvena
buddãnu bhãvena
dhammãnu bhãvena
sanghãnu bhãvena
tejãnu bhãvena
idhyãnu bhãvena
balãnu bhãvena
ṅeyya dhammãnu bhãvena
caturãsiti sahassa
dhammakkhãndhanu bhãvena

nawa lokuttara dhammãnu bhãvena
atthangika maggãnu bhãvena
attha samapatyanu bhãvena
chala bhiññanu bhãvena

mettã karunã muditã upekkãnu
bhãvena,sabba pãramitãnu bhãvena
ratanattaya saranãnu bhãvena,tuyham
sabba roga soka upaddava
dukkha domanassa – pãyãsu
vinassantu,sabba samkappã tuyham
samijjantu-dighãyuko hotu sata vassa
jivena samangiko hotu sabbadã
akãsa pabbata vana bhümi
tatãka gamgã mahã samudda
ãrakkhaka devatã
sadã tumhe anurakkhantu

sabba buddhanu – bhãvena
sabba dhammãnu – bhãvena
sabba sanghãnu – bhãvena
Buddha ratanam
dhamma ratanam
sangha ratanam
tinnam ratanãnam ãnubhãvena
caturãsiti sahassa dhammkkhãnu
bhãvena pitakattayãnu bhãvena
jina savakãnu bhãvena sabbe te roga,
sabbe te bhaya sabbe te antarãyã

sabbe te upaddavã
sabbe te dunnimittã
sabbe te avamangalã vinassantu

ayu vaddhako,
dhana vaddhako,
siri vaddhako,
yasa vaddhako,
bala vaddhako,
vanna vaddhako,
sukha vaddhako,
hotu sabbadã
dukkã rõga bhayã verã
sokã nassantu sabbadã
anekã antarãyãpi
vinassantu ca tejasã

jaya siddhi danam lãbham
sotti bhagyam sukham balam
siriyãyu ca vanno ca
bhõgam vuddhi ca yasavã
sata vassã ca ãyü ca
jiva siddhi bhavantu me

❖

ජය පිරිත - සිංහල අරුත

සෞභාග්‍යයෙන් හා ධෛර්යයෙන් ද, නුවණින් හා තේජසින් ද, උප ලක්ෂිත, මහා සෘද්ධිබල සම්පන්න වූ, මහා ගුණස්කන්ධයකින් පරිපූර්ණ, අප්‍රමාණවූ පුණ්‍ය බල මහිමයෙන් යුක්ත වූ, අනතුරු වළකාලීමෙහි සමත්, ඒ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේගේ ..

දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ආනුභාවයෙන් ද, අසූවක් අනුබුද්ධා ලකුණුවල ආනුභාවයෙන් ද, සවනක් රැස් ආනුභාවයෙන් ද, කේතුමාලානුභාවයෙන් ද, දස පාරමිතානුභාවයෙන් ද, දස උප පාරමිතානුභාවයෙන් ද, දස පරමත්ත පාරමිතානුභාවයෙන් ද , සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවන්ගේ ආනුභාවයෙන් ද, බුද්ධ - ධම්ම - සංඝ යන තෙරුවන්ගේ ආනුභාවයෙන් ද, එම තේජසින්, සෘද්ධියෙන් සහ බලයෙන් ද, දත යුතු සියල්ල දැන වදාරණ ලද්දා වූ ආනුභාවයෙන් ද, අසූ හාර දහසක ධර්මස්කන්ධයේ ආනුභාවයෙන් ද, නව ලොව්තුරු දහමේ ආනුභාවයෙන්ද, ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ආනුභාවයෙන් ද, අෂ්ඨ සමාපත්‍යානුභාවයෙන් ද, සය අභිඥාවන්ගේ ආනුභාවයෙන් ද, මෙත්තා - කරුණා - මුදිතා - උපේක්ෂා යන සිව් බඹ විහරණයන්ගේ ආනුභාවයෙන් ද, සියළු පාරමිතාවන්ගේ ආනුභාවයෙන් ද, තෙරුවන්ගේ මහානුභාවයෙන් ද, ..

.. මාගේ සියළු රෝගාබාධයන් දුරු වේවා ! සියළු සෝ, දුක්, දොම්නස්, පහව යේවා! සිත් වේදනා අපල උපද්‍රවන් දුරු වේවා ! මාගේ සියළු යහපත් බලාපොරොත්තු ඉටුවේවා ! සියළු අරමුණු සාක්ෂාත් වේවා! සියක් වසක් කල් නිරෝගී ලෙස ජීවත් වීමට ශක්තිය, ධෛර්යය හා වාසනාව ලැබේවා!

සියළු කල්හි අහස, පර්වත, වන, බිම්, තටාක, ගංගා හා මහා සයුර අරක්ගත් දෙවියෝ මාගේ රැකවරණය සළස්වත්වා! සියළු බුදු වරුන්ගේ, සියළු සද්ධර්මයේ, සියළු සංඝයාගේ ආනුභාවයෙන්, බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන්ගේ ආනුභාවයෙන්, අසූ හාර දහසක් ධර්මස්කන්ධයේ ආනුභාවයෙන්, ත්‍රිපිටකයේ ආනුභාවයෙන්, බුද්ධ ශ්‍රාවකයාණන් වහන්සේලාගේ ආනුභාවයෙන් මාග සියළු රෝග, සියළු භය, සියළු අනතුරු, සියළු කරදර, සියළු අශුභ නිමිති, සියළු චිත්ත පීඩා වැනසේවා ! දුරු වේවා !

සියළු කල්හි ආයුෂයෙන්, ධනයෙන්, යසයෙන්, බලයෙන්, මෙන්ම වර්ණයෙන් හා සැපයෙන් ද, වර්ධනය වේවා !

දුක් රෝග, භය, වෛර ශෝක ද, කරදර ද සමනය වේවා! විවිධ අනතුරු අන්තරාවන් ද, ඒ තේජසෙන් විනාශ විවා ! ජය සිද්දිය ද, ධන ලාභ ද, සුව සම්පත හා වාසනාවද, සැප බල හා ආයුෂ ද, වර්ණ සම්පත ද, භෝග සම්පත ද, කීර්තිය ද සිය වසකට අධික කාලයක් ආයුෂ වර්ධනයට ද, දේව සිද්ධිය ද, මා හට ලැබේවා!

සියළු උවදුරු දුරු කෙරේවා !
සියළු රෝ දුක් බිය නැසේවා !
කිසිම අයුරක බියක් අන්තරාවක් කිසිදිනක නොම වේවා !
දීර්ඝ ආයුෂ වේවා !!!

Jaya Piritha – Meaning in English

May all your dangers, misery, anguish and restlessness vanish; may all your wishes be fulfilled; may you live long and have longevity blessed with the majesty of the thirty two signs and eighty secondary signs of the Great Teacher, the one hundred and eight auspicious signs, the six colored rays, the aura of the Buddha, the ten Perfections, the ten higher Perfections, the ten crowning Perfections, magnificent with morality, concentration and wisdom.

May you also live long with the grace of the Buddha, the fully Enlightened One, the Dhamma, His noble teaching, the Sangha, (His disciples) who live in splendor with psychic powers, energy, right view, eighty four thousand sections of the Dhamma, nine supra-mundane ideal states, **the Eightfold Path, the eight mental stages of meditation, six super knowledges, Infinite Love, Compassion, Sympathetic Joy, Equanimity, all (thirty) principal virtues under the refuge of the Triple Gem.**

May guardian deities of the sky, the mountains, the forests, the earth, the lakes, the rivers and the great oceans defend (protect) you.

With the grace of the Buddha, Dhamma and Sangha, the Triple Gem, eighty four thousand sections of the Dhamma, the Tripitaka, the holy disciples of the Buddha, may all your illnesses, fears, perils, dangers, bad omens and misfortunes be destroyed.

May you always be a cultivator of longevity, riches, glory, fame, strength, appearance and comfort.

MAY ALL BEINGS BE HAPPY!

SADHU SADHU SADHU...!!!

The value of Pritta- පිරිතෙහි වටිනාකම

The body becomes ill because the mind controlling it either secretly wants to make it ill, or because it is in such a state of agitation that it cannot prevent the body from becoming sick. Whatever it's physical nature, resistance to disease is unquestionably related to the psychological condition of the patient. Now it has been proved.

The mind not only makes one sick, it also cures. An optimistic patient has more chances of getting well than a patient who is worried and unhappy. The recorded instances of faith healing include cases in which natural disease were cured almost immediately. It is obvious that the practice of listening for the recital of Dhamma for protection and deliverance from evil as well as promoting welfare and well being. The selected discourses for recital are known *as paritta sutta . paritta in Pali , Parittrana in Sanskrit* and *Pirith in* Sinhala, all means mainly **"PROTECTION"**.

The practice of reciting and listening to 'Paritta' has been persisting from generation to generation from the very early stage in the history of Buddhism. It is certain that their recital produces mental well being those who listen to them confidently with the truth of the Buddha's words. Such mental well-being can help those who are ill to recover. It has a power to induce a certain attitude which brings happiness to overcome the negative states of mind and keep it balanced. The people who experienced this profit, request others too, to take the best use of *'paritta'*.

This practice is still prevailed in all Buddhist countries. The vibratory sounds that 'Pirith" produces are soothing to the nerves; produce peace of mind and bring harmony to the system successfully. The mind is so closely linked with the body according to Dhamma. Some doctors now say that there is no such purely physical disease without concerning to mental state.

'Paritta' is a form of 'sacca-kiriya'. It depends on "**truth**" for protection, justification, or attainment. The saying, "**The power of truth protects the follower of the truth**"(*Dhammo have rakkhati Dhamma Charim*) is the principle behind theses 'partta sutta' recitals. It's true that '*virtue protects the virtuous*', then a person who listens to these sayings with complete confidence in the truth of the Buddha's words, which spring from complete Enlightenment, will acquire so virtuous a state of mind that he will be able to conquer any evil influence.

According to the Buddha,**Right Effort** is a necessary factor in overcoming suffering (*Viriyena Dukkan Accheti).*Listening to 'Paritta:recital' in proper way can also generate energy for the purpose of doing good, and following the path of worldly progress with diligence. There is no better medicine than truth (*Dhamma*) for both:**mental and physical ills** which are the cause of all suffering and misfortune.

සෑම ශාරීරික ක්‍රියාවකටම මනස පූර්වාංගම වෙයි. සියලු රෝගාබාධයක්ම මනස හා බැඳී පවතී. රෝගියාගේ මනෝ භාවයරෝගයට සෘජුව හෝ වක්‍රාකාරව ඇති කරන්නා වූ බලපෑම ඉමහත්ය.

රෝග ඇති කරවීමට මෙන්ම රෝග සුවකිරීමට ද මනසේ බලපෑම අතිමහත්ය. ස්වාභාවිකව හටගන්නා රෝග, රෝගියාගේ සමතුලිත මානසිකත්වයට සාපේක්ෂව ඉක්මනින් සුව වී යන බවට වෛද්‍යවරුන් පවා අද මත පළකර ඇත. බාහිර බලවේගයක් මගින් පත් කරවනු ලැබූ රෝගී තත්ත්වයන් හමුවේ වුවද, මෙම මානසික ශක්තිය බාහිර වශයෙන් මනසට කා වැද්දවීමේ ක්‍රම වේදයක් ලෙසින් ද, අනාදිමත් කාලයක සිට මෙම "පිරිත" භාවිතා කෙරෙයි. කායික මෙන්ම මානසික අශක්නුතාවයෙන් පෙළෙන්නෙකුට වුවද, පිරිත මගින් ලබාදෙන්නේ, ජීවිත යථාර්ථයට මුහුණ දීමට හැකි පුදුමාකාර ජවයකි. "පිරිත", *විවිධ භාෂාවන්හි පරිත්‍රාණ, පරිත්ත සුත්ත* සහ *පරිත,* ආදී කුමන නම්වලින් හැඳින්වූයේ වුවද, එමගින් ලැබෙනුයේ පූර්ණ ආරක්ෂාවකි. පිරිත **"සත්‍යය" මත ම පදනම් වී , බලගතු අක්ෂර සංයෝජනයකින් සුසැදි ව පැවතීම එයට හේතුවයි.** නිසි ලෙස උච්චාරණය කිරීම ඉතා වැදගත්ය. පිරිත් ස්වරයෙන් ආරෝපණය ලත් පිරිත් නූලක පවා ඇත්තේ **අද්විතීය ආනුභාවයකි.**

මහානුභාව සම්පන්න මෙම පිරිත් දේශනාවන්හි වටිනාකම මැනිය හැකි මිනුම් දණ්ඩක් සොයාගත් විද්‍යාඥයෙක් මේ දක්වා ලොව පහළ වී නැත. බුදු පියාණන් වහන්සේගේ බුදු ගුණස්කන්ධයත්, අසූ හාර දහසක ධර්මස්කන්ධයත්, අනුගාමික සංඝ රත්නයේ අප්‍රමාණ ගුණස්කන්ධයත් අසීමිතය. එහි **"සත්‍යය"** අසත්‍ය කිරීමට හෝ එහි අන්තර්ගතය විකෘති කිරීමට හෝ එය ලඝු කොට හුවා දැක්වීමට හෝ උපන් ශ්‍රේෂ්ඨයෙකු මෙම මිහිතලය මත දෘශ්‍යමාන වන්නේ ද නැත. එක් බුදුවරයෙකුගේ ගුණ සමුදාය තවත් බුදුවරයෙකු විසින් කල්ප ගණනක් පුරා දේශනා කළ ද. කල්ප ගණන අවසන් වනු විනා බුදු ගුණස්කන්ධය අවසන් නොවන බව බුද්ධ වචනයයි. බුද්ධ විෂය අචින්ත්‍යයි. එවන් අප්‍රමාණ ගුණස්කන්ධයකින් හෙබි බුදු පියාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හෙවත් **"බුදු ගුණ කඳ"** සිහිපත් කිරීමෙන්

පවා මනසට දැනෙන්නේ අප්‍රමාණ සුවයකි. එම ගුණ කඳ සිතා නිම කළ නොහැක. ගයා නිම කළ නොහැක. ලියා නිම කළ නොහැක. ත්‍රිවිධ රත්නයේ මෙම අනන්ත ගුණ සිහිපත් කිරීමෙන් පවා හදවතකට ඇතිවන්නේ අසීමිත සැනසීමකි.

එවන් වූ සත්‍ය මත පදනම් වූ "පිරිතෙහි" ආනුභාවය ඉතා බලගතුය. එමගින් කායික රෝග සුවවීම පමණක් නොව විසාලා මහනුවර වැනි දැවැන්ත නගරයන්හි ජනතාව පීඩාවට පත් කල අමනුෂ්‍ය , දුර්භික්‍ෂ, රෝග බිය සියල්ලක් පහව ගිය බවට බෞද්ධ ඉතිහාසය සාක්‍ෂි දරයි. බුදු පියාණන් වහන්සේගෙන් කමටහන් ලබාගෙන භාවනායෝගීව වැඩ සිටීමට වනයට පිවිසි 500 ක් භික්‍ෂුන් වහන්සේ පළවා හැරීමේ අදහසින්, එහි අධිගෘහිත වෘක්‍ෂදේවතාවෝ බියකරු ශබ්ද, අද්භූත රූප මවන්නට වූහ. එයින් බියට පත්ව රෝගාතුර වූ භික්‍ෂු පිරිස ආපසු ගොස් බුදු පියාණන් වහන්සේට පුවත සැළ කළ කල්හි, සැමට මෛත්‍රී වැඩීමෙන්, පැමිණ ඇති සියලු බාධක දුරු කර ගත හැකි බව පෙන්වා කරණීය මෙත්ත සූත්‍රය දේශනා කළ සේක.එය හොඳින් ඉගෙන කටපාඩම් කරගත්. 500 භික්‍ෂුන් වහන්සේලා **මෛත්‍රීයෙන් සන්නද්ධව** එම වනයටම ආපසු වැඩම කොට බවුන් වඩද්දී,වෘක්‍ෂ දේවතාවුන් ඔවුනට සහාය දක්වන්නට වූයෙන්, මාර්ග ඵල ලබා නිවන් මග පසක් කර ගත්හ.

මෙවන් වූ සුවිශේෂී බලයක් "පිරිතෙහි" අන්තර්ගතය. බුදුපියාණන්ගේ පරිනිර්වාණයෙන් පසු ද, මෙහි **"සත්‍යය"** අවබෝධ කරගත්, ධර්මධර, විනයධර භික්‍ෂුන් වහන්සේ එක් රැස්ව සිදුකළ කතිකාවන් හමුවේ ප්‍රචලිත වූ පිරිත් ගණනාවකි. ඒ සියල්ලක් . **"සත්‍යය" මත ම පදනම් වී** ඇති හෙයින් එහි බලය ද අනූනය.. **"ජය පිරිත"** ද එලෙස ප්‍රචලිත වූ **"සත්‍ය ක්‍රියාවකි"**.

සැදැහැ සිතින් යුතුව නිසි ලෙසතිසරණ සහිත පංච ශීලයෙහි පිහිටා මෙම පිරිත සජ්ඣායනා කරන්නකුට, ශ්‍රවණය කරන්නකුට එසේත් නැත්නම් නෙතට දෘශ්‍යමාන වනසේ ලියා තබා සිතට ආරෝපණය කරගන්නෙකුට, පිරිත තුළ ගැබ්ව ඇති අප්‍රමාණ ශක්තියෙන් නිසිඵල ඒකාන්ත වශයෙන්ම ලබාගත හැකිවනු ඇත.

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///

බුද්ධානුස්සතිය (Buddhanussatiya)

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ සියළු කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක. රහසින්වත් පව් නොකළ සේක. සියලු පාපයන්ගෙන් මිදුණා සේක. සියලු ලෝ වැසියන්ගේ ආමිස පූජා, ප්‍රතිපත්ති පූජා පිළිගැනීමට සුදුසු වන සේක.

බුදුරජාණන් වහන්සේ ඇසින් රූප දැක ඒ රූප කෙරෙහි නොඇළුණ සේක. නොගැටුණ සේක. මුලා නොවුන සේක. ආශාව දුරු කළසේක.

කණින් ශබ්ද අසා ශබ්ද කෙරෙහි නොඇළුණ සේක. නොගැටුණ සේක. මුලා නොවුන සේක. ආශාව දුරු කළසේක.

නාසයෙන් ගඳ සුවඳ දැන ඒ ගඳ සුවඳ කෙරෙහි නොඇළුණ සේක. නොගැටුණ සේක. මුලා නොවුන සේක. ආශාව දුරු කළසේක.

දිවෙන් රස විඳ ඒ රසය කෙරෙහි නොඇළුණ සේක. නොගැටුණ සේක. මුලා නොවුන සේක. ආශාව දුරු කළසේක.

කයින් පහස ලබා ඒ පහස කෙරෙහි නොඇළුණ සේක. නොගැටුණ සේක. මුලා නොවුන සේක. ආශාව දුරු කළසේක.

මනසින් අරමුණු දැන ඒ අරමුණ කෙරෙහි නොඇළුණ සේක. නොගැටුණ සේක. මුලා නොවුන සේක. ආශාව දුරු කළසේක.

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ **"අරහං"** නම් වන සේක. **"අරහං"** නම් වන සේක. **"අරහං"** නම් වන සේක. **"අරහං"** යන **සම්බුදු ගුණයෙන්** යුතු මාගේ ශාස්තෘන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ අවබෝධ කළයුතු "**දුක**" නම් වූ ආර්ය සත්‍යය ගුරු උපදේශ නැතිවම *අවබෝධ කොට වදාළ සේක.* ප්‍රහාණය කළ යුතු "**දුක හටගැනීම**" හටගැනීම නම් වූ ආර්ය සත්‍යය ගුරු උපදේශ නැතිවම *ප්‍රහාණය කොට වදාළ සේක.* සාක්ෂාත් කළ යුතු "**දුක නැතිවීම**" නම් වූ ආර්ය සත්‍යය ගුරු උපදේශ නැතිවම *සාක්ෂාත් කොට වදාළ සේක.* ප්‍රගුණ කළයුතු "**දුක නැතිවී මේ මග**" නම් වූ ආර්ය සත්‍යය, ගුරු උපදේශ නැතිවම *ප්‍රගුණ කොට වදාළ සේක.*

මෙම චතුරාර්ය සත්‍ය ධර්මයන් **සත්‍ය ඥාණ**, **කෘත්‍ය ඥාණ**, **කෘත ඥාණ** වශයෙන්ද, පරිවර්තන 3 කින් යුතුව ආකාර දොළසකින් යුතුව, ගුරු උපදේශ නැතිවම *අවබෝධ කොට වදාළ* නිසා **සම්මා සම්බුද්ධ** වන සේක. "**සම්මා සම්බුද්ධ**" යන සම්බුදු ගුණයෙන් යුතු **මාගේ ශාස්තෘන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !**

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ සියල ලෝක සත්ත්වයන්ගේ අතීත ජීවිත දැකීමේ හැකියාව වූ **පුබ්බේනිවාසානුස්සති ඥාණය** ලබාගත් සේක.

සියලු ලෝක සත්ත්වයන් උපදින ආකාරයද, කර්මානුරූපීව චුතවන ආකාරයද දැනීමේ හැකියාව වූ **චුතූප්පාද ඥාණය** ලබාගත් සේක.

දුර තිබෙන රූපයන්ද, ළග තිබෙන රූපයන්ද, දැකීමේ හැකියාව වූ **දිබ්බ චක්ඛු ඥාණය** ලබාගත් සේක.

දුර තිබෙන ශබ්දයන්ද, ළග තිබෙන ශබ්දයන්ද, ඇසීමේ හැකියාව වූ **දිබ්බ සෝත ඥාණය** ලබාගත් සේක.

අහසින් ගමන් කිරීමද, පොළොවෙන් කිමිදී වෙනත් ස්ථානයකින් මතුවීම ද, ජලය මතුපිට සක්මන් කිරීම ද, විනිවිද නොපෙනී ගමන් කිරීම ආදී අනන්ත ප්‍රාතිහාර්යයන්ගෙන් යුතු **ඍද්ධිවිද ඥාණය** ලබාගත් සේක.

සියලු ආශ්‍රවයන් මුළුමනින්ම නැතිකොට ඥාණාලෝකය උපදවාගෙන **ආසවක්ඛෂය ඥාණය** ලබාගත් සේක.

මෙසේ අනන්ත ඥාණයෙන්ද, අනන්ත සීලයෙන්ද, අනන්ත සමාධියෙන්ද, අනන්ත ගුණයෙන්ද සමන්විත නිසා බුදුරජාණන් වහන්සේ **"විජ්ජාචරණ සම්පන්න"** වන සේක. ඒ **විජ්ජාචරණ සම්පන්න** නම් වූ **සම්බුද්ධ ගුණයෙන්** යුතු මාගේ ශාස්තෘන් වහන්සේට මම නමස්කාර කරමි. **මාගේ නමස්කාරය වේවා !**

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ, සුන්දර වූ නිවන් මග සොයාගෙන, සුන්දර නිවනට වැඩම කළ නිසා **"සුගත"** වන සේක. සුගත නම් වූ **සම්බුද්ධ ගුණයෙන්** යුතු මාගේ ශාස්තෘන් වහන්සේට මම නමස්කාර කරමි. **මාගේ නමස්කාරය වේවා !**

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ, **සියලු බ්‍රහ්ම ලෝකද, සියලු දිව්‍ය ලෝකද, මිනිස් ලෝකද, සියලු ප්‍රේත ලෝකද, සතර අපායද,** මේ සියලු ලෝකයන් අවබෝධ කොට ගෙන සියලු ලෝකවලින් නිදහස් වූ නිසා **"ලෝක විදූ"** වන සේක. ඒ **"ලෝක විදූ"** නම් වූ **සම්බුද්ධ ගුණයෙන්** යුතු මාගේ ශාස්තෘන් වහන්සේට මම නමස්කාර කරමි. **මාගේ නමස්කාරය වේවා !**

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ ඍද්ධි ප්‍රාතිහාර්යයෙන් අනුන්ගේ සිත් දකිමින්, දහම් දෙසීම නම් වූ ආදේශනා ප්‍රාතිහාර්යයෙන් ද අනුශාසනා ප්‍රාතිහාර්යයෙන් ද, පින් ඇති දෙව් මිනිසුන්ව දමනය කොට අමා මහ නිවනට පමුණුවා වදාළ නිසා **"අනුත්තර පුරිස ධම්ම සාරථී "** වන සේක. **"අනුත්තර පුරිස ධම්ම සාරථී "** වන සේක. . ඒ **"අනුත්තර පුරිස ධම්ම සාරථී "** නම් වූ **සම්බුද්ධ ගුණයෙන්** යුතු මාගේ ශාස්තෘන් වහන්සේට මම නමස්කාර කරමි. **මාගේ නමස්කාරය වේවා !**

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ නුවණැති දෙවියන්ටද, නුවණැති මිනිසුන්ටද. සසර කතරින් එතෙර වීම පිණිස මාර්ගය පෙන්වා වදාළ නිසා **"සත්ථා දේව මනුස්සානං"** වන සේක. **"සත්ථා දේව මනුස්සානං"** නම් වූ **සම්බුද්ධ ගුණයෙන්** යුතු මාගේ ශාස්තෘන් වහන්සේට මම නමස්කාර කරමි. **මාගේ නමස්කාරය වේවා !**

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ, අවබෝධකොට වදාළ චතුරාර්ය සත්‍යය ධර්මයන් අන්‍යන්ටද අවබෝධ කර ගැනීම පිණිස මහා කරුණාවෙන් දේශනා කොට වදාළ නිසා **"බුද්ධ"** වන සේක. **"බුද්ධ"** වන සේක. **"බුද්ධ"** වන සේක. ඒ **"බුද්ධ"** නම් වූ සම්බුදු ගුණයෙන් යුතු මාගේ ශාස්තෘන් වහන්සේට මම නමස්කාර කරමි. **මාගේ නමස්කාරය වේවා !**

මාගේ ස්වාමි වූ බුදුරජාණන් වහන්සේ, මේ සියලු සම්බුදු ගුණ දරාගැනීමට තරම් භාග්‍යවන්ත වන සේක. මහා කරුණාවෙන් සිසිල් වී ගිය හද මඬලක් දරා ගැනීමට තරම් භාග්‍යවන්ත වන සේක.හිරු, සඳු පරදවන අනන්ත එළිය විහිදුවන ඥාණාලෝකය ලබා ගැනීමට තරම් භාග්‍යවන්ත වන සේක. බුදුරජාණන් වහන්සේ " **භගවා** " වන සේක. " **භගවා** " වන සේක. " **භගවා** " වන සේක. " **භගවා** " නම් වූ **සම්බුදු ගුණයෙන් යුතු** මාගේ ශාස්තෘන් වහන්සේට මම නමස්කාර කරමි. **මාගේ නමස්කාරය වේවා !**

අනන්ත ගුණයෙන් යුතු, අනන්ත ඥාණයෙන් යුතු, මහා කරුණාවෙන් යුතු මාගේ ශාස්තෘන් වහන්සේට මම නමස්කාර කරමි. **මාගේ නමස්කාරය වේවා !**. දෙවනුවද මම නමස්කාර කරමි. **මාගේ නමස්කාරය වේවා !**. තෙවනුවද මම නමස්කාර කරමි. **මාගේ නමස්කාරය වේවා !**

මාගේ ජීවිතය තිබෙන තුරාම **බුදුරජාණන් වහන්සේව** මම සරණ යමි. මුළු හදවතින්ම මම සරණ යමි. මුළු හදවතින්ම මම සරණ යමි. නිවන් දක්නා තුරා මුළු හදවතින්ම මම සරණ යමි.

*"**I forfeit my homage** to the Exalted One, the worthy One Perfectly Enlightened One: Endowed with clear vision and virtuous conduct, walked on the correct path having a clear destination, the knower of the world, the incomparable leader of all beings to be tamed, the teacher of god and men"*

බුදුරජාණන් වහන්සේ විසින් ඉතා යහපත් ලෙස දේශනා කොට වදාළ **ශ්‍රී සද්ධර්මය** මම සරණ යමි. මාගේ ජීවිතයේ අවසාන හුස්ම

පොද දක්වාම මම ශ්‍රී සද්ධර්මය සරණ යමි. මුළු හදවතින්ම මම සරණ යමි.

*“ **I forfeit my homage** to the **Dhamma** of the Exalted One , which is perfectly expounded from the beginning to the end: exist and can be seen; not limited for a certain period; inviting one to come and see; leading onwards to Nibbana ; to be individually realized by the wise.”*

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ මහ රහතන් වහන්සේලාගේ පටන් සියලුම මාර්ග ඵල ලාභී ශ්‍රාවක සංඝ රත්නය මම සරණ යමි. මුළු හදවතින්ම සරණ යමි. . මාගේ ජීවිතයේ අවසාන හුස්ම පොද දක්වාම මම **සංඝ රත්නය** සරණ යමි. මුළු හදවතින්ම මම සරණ යමි.

*“ **I forfeit my homage** to the **Sangha** who walk along the true path, straight Path, correct path and proper path ; having path and fruit both: they are worthy for gifts: worthy for hospitality: worthy for offerings and reverential salutation , as the unique field of merit for the entire world.”*

*May the **Buddha** be at my head, **Dhamma** in my heart and **Sangha** at my side to protect and guide me always!!!*

මේ උතුම් තිසරණය මාගේ ජීවිතයට එකම **ආලෝකය** වේවා!

මේ උතුම් තිසරණය මාගේ ජීවිතයට එකම **රැකවරණය** වේවා!

මේ උතුම් තිසරණය මාගේ ජීවිතයට එකම **සැනසීම** වේවා!

සාධු! සාධු! සාධු!